2023

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report















සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

Department of Animal Production and Health

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்திர செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2023

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம
Department of Animal Production and Health
Peradeniya
SriLanka
Tel: 94-081-2388337/2388462
Fax: 94-081-2388619
Web Site: www.daph.gov.lk

පටුන

පිටු අංකය

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 01
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01
1.3. ප්‍රධාන කාර්යයන් 02
1.4. සංවිධාන සටහන 04
1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 07
1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 07
1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය 09
2.2. 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 14
2.3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ව්‍යාපෘති 15

3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 16
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 18
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 19
3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 20
3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 21
3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව 22

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 35

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 35
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 36

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 37
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති ආකාරය 37
6.3. මානව සම්පත් සංවර්ධනය 38

7. අනුකූලතා වාර්තාව 41

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 292

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

1.2.2. මෙහෙවර

නිරෝගීමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

1.2.3. අරමුණු

- සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- පශු එන්නත්සාර සහ අනෙකුත් පශු ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණාගාර සේවා සම්මත පරීක්ෂණාගාර තුලදී ඉටුකර දීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පනත් සහ රෙගුලාසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම හා නිරීක්ෂණය කිරීම.
- තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- පරිසර හිතකාමී, විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.


1.3. ප්‍රධාන කාර්යයන්

- ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘතිම සිංචන වැඩසටහන මෙහෙයවීම.
- අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය.
- සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
- එළුවන්ගේ ආරය නැංවීම.
- වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රවලිත කිරීම.
- රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රැනිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය.

- සැල්මොනෙල්ලෝසිස් හා රැනිකට් රෝග පාලනය.
- අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම.
- සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.
- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම.
- පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම.
- කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම.
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම.
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම.
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය.
- කුකුළු පාලනයට අදාළ නියාමන කටයුතු.
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු.
- අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය.
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/ සීප්පුකුලම) පවත්වාගෙන යාම.
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම.
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන පැවැත්වීම.
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම.
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම.
- පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය.
- පරිසර හිතකාමී පශු සම්පත් ගොවිපළ පහසුකරණය.
- ව්‍යාප්ති සේවාවන් සැපයීම.

1.4. සංවිධාන සටහන

Organizational Structure



Other Staff: DO, DA, Le.Ass, Pro.Ass., TO, Drftm, RA, MSO, LIB, LDO
Dri, Tra.Ope., LA, Mech, BO, Car, Elec, Ban.Kee, Watc, BBC, MM, GtC, AG, LM, KKS, ACA, GL, SL, FA

DG	-අධ්‍යක්ෂ ජනරාල්
ADG	-අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
D/AD	- අධ්‍යක්ෂ, පරිපාලන
D/VRA	- අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
D/LPE	- අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
D/HRD	- අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
D/AB	- අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
D/VR	- අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
D/AH	- අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
CA	-ප්‍රධාන ගණකාධිකාරී
CLE	-ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ
CE	- ප්‍රධාන වසංගතවේදී
VPH.Sp.	-පශු මහජන සෞඛ්‍ය විශේෂඥ
P.Sc	-ප්‍රධාන විද්‍යාඥ
DE.Sp.	-කිරිගව ඉංජිනේරු විශේෂඥ
Vet.In.Sp.	-පශු විමර්ශන විශේෂඥ
C.Vac	-ප්‍රධාන එන්නත්වේදී
R/AF	-ලේඛකාධිකාරී (සත්ත්ව ආහාර)
R/VD	-ලේඛකාධිකාරී (පශු ඖෂධ)
CAQO	-ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී
AB.Sp.	-සත්ත්ව අභිජනන විශේෂඥ
VR.Sp.	-පශු ප්‍රජනන විශේෂඥ
C.Agro.	-ප්‍රධාන ශෂ්‍යවේදී
LE.Sp.	-පශු ව්‍යාප්තිසේවා විශේෂඥ
CIA	-ප්‍රධාන අභ්‍යන්තර විගණක
Acct.	-ගණකාධිකාරී

DD/AH	-නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
DD/VR	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
DD/R	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ
DD/TS	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය
DD/LPE	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
DD/HRD	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
DD/AB	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
DD/DD	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, කිරිගව සංවර්ධන
LE	-පශු ආර්ථික විශේෂඥ
AD. Ad	-සහකාර අධ්‍යක්ෂ, පරිපාලන
SVP	-එන්නත්සාර අධිකාරී
AQO	- සත්ත්ව නිරෝධායන නිලධාරී
VRO	- පශු පර්යේෂණ නිලධාරී
VIO	- පශු විමර්ශන නිලධාරී
VS	-පශු වෛද්‍ය නිලධාරී
LO	-සත්ත්ව පාලන නිලධාරී
RO	-පර්යේෂණ නිලධාරී
Leo	-නීති නිලධාරී
Eng.	-සිවිල් ඉංජිනේරු
AO	-පරිපාලන නිලධාරී
RA/S	-පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය)
LPO	-පශු සම්පත් ප්‍රවර්ධන නිලධාරී
Trl	-භාෂා පරිවර්තක
I & CTO	-තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
SO	-සංඛ්‍යාලේඛනඥ

අනෙකුත් කාර්ය මණ්ඩලය

DO	-සංවර්ධන නිලධාරී
DA	-සංවර්ධන සහකාර
Le.Ass	-නීති සහකාර
Pro.Ass.	-වැඩසටහන් සහකාර
RA	- පර්යේෂණ සහකාර
LDO	-පශු සම්පත් සංවර්ධන නිලධාරී
TO	-තාක්ෂණ නිලධාරී
Drftm	-සැලසුම් ශිල්පී
MSO	-කළමණාකරන සේවා නිලධාරී
LIB	-පුස්තකාලාධිපති
WR	-නේවාසිකාගාර පාලක
Dri	-රියදුරු
Tra.Ope.	-ට්‍රැක්ටර් ක්‍රියාකරු
LA	-රසායනාගාර සහායක
Mech	-යාන්ත්‍රික ශිල්පී
BO	-බොයිලේරුකරු
Car	-වඩුකරු
Elec	-විදුලි ශිල්පී
Ban.Kee.	-බංගලා භාරකරු
Watc	-මුරකරු
BBC	-පට්ටි ගොනුන් රැකබලාගන්නා
MM	-කිරිකරු
GtC	-එළුවන් රැකබලාගන්නා

AG	- සත්ත්ව රැකවල්කරු
LM	-තණකොළ කපන්නා
KKS	-කාර්යාල කාර්ය සහායක
ACA	-සත්ත්ව පාලන සහායක
GL	-උද්‍යාන කම්කරු
SL	-සනීපාරක්ෂක කම්කරු
FA	-ක්ෂේත්‍ර සහායක

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- සත්ත්ව අභිජනන අංශය
- සත්ත්ව සෞඛ්‍ය අංශය
- පශු අණුපනත් හා නීති අංශය
- පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- පශු පර්යේෂණ ආයතනය
- මුදල් අංශය
- පරිපාලන අංශය
- ව්‍යවසායකත්ව හා ආයෝජන ප්‍රවර්ධන ඒකකය

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන

- සත්ත්ව අභිජනන අංශය
  කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
  එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)

- සත්ත්ව සෞඛ්‍ය අංශය
  පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)

- පශු අණුපනත් හා නීති අංශය
  සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ, කටුනායක, මත්තල, යාපනය)

- මානව සම්පත් සංවර්ධන අංශය
  සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල, සීප්පුකුලම)
  අඛණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
  පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව
  පශු ව්‍යාප්ති සේවා කවුළුව- ප්‍රධාන කාර්යාලය

- පශු පර්යේෂණ ආයතනය
  මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය - කරඳගොල්ල
  සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
  කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

FAO මූල්‍යාධාර සහිතව ක්‍රියාත්මක වන "ගුණාත්මක තෘණ හා රනිල ප්‍රභේද හඳුන්වාදීමෙන් හා ඒවායේ පෝෂණ තත්ත්වය කළමනාකරණය කිරීම තුළින් සුළු පරිමාණ කිරි ගොවීන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය" 2023 වර්ෂයේදී ක්‍රියාත්මක විය. 2023 වර්ෂය සඳහා රු.මි. 4.9 ක විදේශාධාර ලැබුණු අතර 2023.12.31 දිනට රු.මි. 0.33 ක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබුණි. මේ යටතේ පර්යේෂණාත්මක තවාන් (Experimental nursery) 03 ක් විවිධ දේශගුණික කලාප අනුව පිහිටුවන ලදී. Stylosanthes guianesis cv. guianesis පෝෂ රනිල වර්ගය තායිලන්තයෙන් ආනයනය කළ බීජ මගින් වගාව ආරම්භ කර, අනුවර්තනය වීමේ පරීක්ෂණ (adaptability test) කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2023 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)

අ/අ	වැඩසටහන	2023 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි)	2023.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි)	මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	භෞතික ප්‍රගතිය (%)
1	සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය	200.00	182.69	91.35	75
2	සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන	45.00	21.28	47.3	62
3	කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය	126.50	15.50	12.26	45
4	බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන	20.00	17.15	85.73	37
5	උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම	40.00	34.75	86.88	76
6	පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම	12.00	1.06	8.83	66
7	පශු සම්පත් පර්යේෂණ වැඩසටහන	78.50	77.20	98.35	92
8	වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය	71.0	21.52	30.31	51
9	පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම	15.00	2.03	13.55	31
10	සතුන් හඳුනාගැනීමේ වැඩසටහන	20.00	19.74	98.69	75
11	සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය	6.00	4.13	68.84	100
12	කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම	10.00	7.13	71.27	90
13	වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන	2.00	2.00	100	78
14	සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම	20.00	20.00	100	100
15	සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම	10.00	9.97	99.66	62
16	තත්ත්ව ආරක්ෂණ වැඩසටහන, සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන, පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන,පොත් හා ප්‍රකාශන වැඩසටහන	16.00	6.91	43.2	63.5
17	කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම තුළින් තත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය	100.00	25.47	25.47	92

2.1. 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2.1.1. පශු සම්පත් සංවර්ධනය

2.1.1.1. කිරි ගව ක්ෂේත්‍රය

අ. සතුන්ගේ ආරය වැඩිදියුණු කිරීම සහ සතුන් අභිජනනය

රට තුළ කිරි නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහනය ගුණාත්මකව වැඩිකර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර නිෂ්පාදනය කර බෙදාහැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම හා සංවර්ධනය සහ තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

සමාලෝචිත කාල සීමාව තුළදී සත්ත්ව අභිජනන වැඩසටහනේ ප්‍රගතිය	
කුණ්ඩසාලේ සහ පොළොන්නරුවේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන මගින් නිෂ්පාදිත ශුක්‍ර ඩෝස් ප්‍රමාණය	*148,493*
ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකළ කෘත්‍රිම සිංචන සංඛ්‍යාව	*205,586*
කෘත්‍රිම සිංචනය කරන ලද එළදෙනුන් / වැස්සියන් සඳහා ගැබ් පරීක්ෂාවන් (ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින්)	*74,519*
වාර්තා වී ඇති පැටවි උපත් සංඛ්‍යාව	*64,064*

ආ. වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩිකිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපොළ මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුවයි. රට තුළ අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහනය වැඩිකිරීමටද එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩු දෙන පරිදි කෘත්‍රිම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සඳහා සහනාධාර ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

මේ යටතේ 2023.12.31 වන විට පැටවු ලියාපදිංචි කිරීම් 4,937 ක් සිදු කර ඇති අතර පැටවු ආහාර කි.ග්‍රෑ. 60,650 ක් බෙදාහැර ඇත. පසුගිය වර්ෂවල ව්‍යාපෘතියට ඇතුලත්ව ඉටුකළ කාර්යයන් වෙනුවෙන් ගෙවිය යුතු දෙවන වාරික ගෙවීම් 478 ක් ද, තෙවන වාරික ගෙවීම් 272 ක් සහ සිව්වන වාරික ගෙවීම් 189 ක් ගොවීන් වෙත ලබාදී ඇත.

ඇ. සත්ත්ව ආහාර සම්පත් ප්‍රවර්ධනය

සත්ත්ව ආහාර සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ශුක්‍ර දායක පුං ගවයින්ගේ රළු ආහාර අවශ්‍යතාවය සඳහා අක්කර තුනක (03) භූමිය ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් වැඩිදියුණු කළ නේපියර් තෘණ වගාවක් ස්ථාපනය කරන ලදී.

- වෙනත් රාජ්‍ය ආයතන සමග එක්ව වැඩිදියුණු කළ තෘණ වර්ග ව්‍යාප්ත කිරීම යටතේ පොල් වගා මණ්ඩලය සමග එක්ව යටි වගාවක් ලෙස නේපියර් තෘණ සංස්ථාපනයට අදාල පුහුණු වැඩසටහනක් හා ආදර්ශ වගාවක් මාවතගම ඩෙසිවැලි පොල් තවානේ දී සිදු කර ඇත.

- වැඩි දියුණු කළ තෘණ වර්ගවල රෝපණ ද්‍රව්‍ය 2,650 ක් දෙපාර්තමේන්තු තෘණ තවාන් මගින් නිකුත් කිරීම හා රෝපණ ද්‍රවය 81,000 ක් පමණ ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික තෘණ ව්‍යවසායකයින් හරහා ක්ෂේත්‍රයට ලබාදීමට පහසුකම් සපයා දී ඇත.

2.1.1.2. එළු ක්ෂේත්‍රය

උසස් ආරයේ අභිජනන එළුවන් සඳහා පවතින ඉල්ලුමට සරිලන ලෙස ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර පිහිටි එළු අභිජනන ගොවිපොළවල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. එළු ගහනය වර්ධනය කිරීම යටතේ තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ 2023.12.31 දිනට මුළු පැටවු උපත් සංඛ්‍යාව 108 ක් වන අතර ගොවිපොළෙන් අභිජනනයට සුදුසු එළුවන් නිකුත් කිරීමට අදාළව පට්ටි එළුවන් 64 ක් ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේ Caprine Arthritis Encephalitis (CAE) රෝගය පැතිරීම හේතුවෙන් සතුන් නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

2.1.1.3. කුකුළු ක්ෂේත්‍රය

මෙරට කුකුළු කර්මාන්තය තුළ පෞද්ගලික අංශය සිදුකරනු ලබන කාර්යයන් හා සැසඳූ විට රාජ්‍ය අංශයේ කාර්යභාරය, නීති සහ තත්ත්ව සහතික කිරීමට පමණක් සීමාවී ඇත.

විදේශ රටවල කුරුළු උණ ව්‍යාප්ත වීම හේතුවෙන් මව්පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේදී සීමාවන් පනවා එම රෝග මෙරටට සංක්‍රමණය වීම වැලැක්වීමට ගුවන් තොටුපල හා වරායන්හි පිහිටුවා ඇති සත්ත්ව නිරෝධායන කාර්යාල මගින් රෝග වලක්වාලීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය මගින් හා ආනයනය මගින් සපුරා ගැනේ. වර්තමානයේ බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවයෙන් 81.35% ක් මෙරට බ්‍රොයිලර් මුතුන් මිත්තන් ඇති කරන ගොවිපොළ 03 ක් මගින් නිපදවනු ලබයි. 2023 දෙසැම්බර් මාසය වනවිට ප්‍රගතිය පහත පරිදි වේ.

දේශීය නිෂ්පාදනය - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*1,159,834*
ආනයනය - බ්‍රොයිලර් මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන්	*46,121*
- බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*282,891*
- ලේයර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*116,935*

අභිජනන ගොවිපොළ මගින් මෙම කාලය තුළදී බ්‍රොයිලර් පැටවුන් මිලියන 166.82 ක් ද බිත්තර දමන කිකිළි පැටවුන් මිලියන 7.29 ක් ද නිෂ්පාදනය කරනු ලැබ ඇත. එසේම කුඩා පරිමාණ කුකුළු පාලන ගොවීන්ට නොමිලේ බෙදාදීම සඳහා පශු පර්යේෂණ ආයතනය විසින් රැනිකට් රෝගය සඳහා එන්නත් නිපදවනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළදී රැනිකට් එන්නත් සාර වඩි 4,619,200 ක් නිෂ්පාදනය කර ඇති අතර කුකුළන් 4,034,885 ක් සඳහා රැනිකට් එන්නත ලබාදී ඇත.

2.1.2. සත්ත්ව සෞඛ්‍යය වැඩිදියුණු කිරීම

අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ත්ව ගහනයක් පවත්වාගෙන යාමට මුළු දිවයින පුරා සාර්ථක අයුරින් රෝග වැලැක්වීම හා මර්දනය කිරීම පිණිස වන සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබාදීම උපරිම වැදගත්කමකින් යුතු වූවකි. ශ්‍රී ලංකාවේ බෝවන සත්ත්ව රෝග

පැතිරීම වැලැක්වීම සඳහා එන්නත් කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමඟ එක්වී ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

එන්නත් වර්ගය	*ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන*
කුර සහ මුඛ රෝග	*203,776*
ගව රක්තාශ්‍රව	*125,960*
කාලගාත්‍රා	*174,186*
බෘසෙල්ලා	*3,666*

ආ. කුරුළු උණ මෙරටට ඇතුළුවීම වැලැක්වීම

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙස පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට කුරුළු උණ ඇතුළුවුවහොත් එම රෝගය මැඩපවත්වා තුරන් කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සූදානම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් රෝග ආවේක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන යටතේ කුකුළු අභිජනන ගොවිපොළ නිරීක්ෂණ 94 ක්ද බීජ රක්කවනාගාර නිරීක්ෂණ 116 ක්ද සිදුකර ඇත. රැනිකට් රෝග පාලනය යටතේ යටතේ එන්නත් 6,208,800 ක් බෙදා හැර ඇත. කුරුළු උණ ආවේක්ෂණ කටයුතු යටතේ දිවයිනම ආවරණය වන පරිදි, රුධිර සාම්පල 5,107 ක් හා වසුරු සාම්පල සහ Cloacal swabs 22,959 ක් සාම්පල එක්රැස් කර පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර, ඒවා රෝගයෙන් තොර බවට තීරණය කෙරිණි.

ඇ. සත්ත්ව නිරෝධායන සහ පරීක්ෂා කිරීමේ සේවාව ශක්තිමත් කිරීම

මෙරටට යම්කිසි ආගන්තුක (විදේශීය) සත්ත්ව රෝගයක් ඇතුළුවීමට එරෙහිව ඇති පළමු ඉදිරි ආරක්ෂක ක්‍රමය සත්ත්ව නිරෝධායන සේවාවයි. අභිජනන කුකුළන් ආනයනය කිරීමෙන් පසු නිරෝධායනය කිරීමට හා අපනයන වෙළෙඳපොළ සඳහා වන විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව ගුණාත්මක බවින් නගාසිටුවීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය 2008 දී ආරම්භ කරන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළදී මෙම වැඩසටහන යටතේ ආනයනය කළ දිනක් වයසැති කුකුළු පැටවුන් කණ්ඩායම් 57 ක් නිරෝධායන පරීක්ෂාවට භාජනය කරන ලදී. මීට අමතරව, මත්ස්‍ය ගොවිපොළවල් 51 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

ඈ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත් වල තත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනයත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2023 වසරේදී ගව රක්තාශ්‍රව, කාලගාත්‍රා, රැනිකට්, කුකුළු වසූරිය සහ Swine Pasteurellosis (SP) එන්නත් දේශීයව නිපදවීමට අවශ්‍ය පහසුකම් සැපයීම සහ වැඩිදියුණු කිරීම සිදුකර ඇත.

එන්නත් වර්ගය	*වාර්ෂික ඉලක්කය*	*2023.12.31 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය*
ගව රක්තාශ්‍රව රෝග	*205,000*	*202,440*
කාලගාත්‍රා	*70,000*	*69,069*
රැනිකට්	*3,630,000*	*3,328,000*
කුකුළු වසූරිය	*ඉල්ලුම පරිදි*	*344,080*
Swine Pasteurellosis (SP)		*3,600*

ඉ. පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන්ම අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍යයන්, ඉස්සන් හා කුකුළු ගොවිපොළ සඳහා ඉක්මන්, සාධාරණය හා වඩාත් ලාභදායක ක්‍රමයක් යටතේ අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ හරහා රෝග නිර්ණය කිරීමට අපේක්ෂිතය.එමඟින් එම රෝග පාලනය වෙනුවෙන් ක්ෂණික පියවර ගැනීමට අදාළ ගොවිපොළ හිමියනට අවස්ථාව උදාවනු ඇත.

2023 වසරේදී මෙම ව්‍යාපෘතිය හරහා මූලිකවම කුකුළු ගොවිපොළ වල ELISA පරීක්ෂණ කටයුතු සිදුකරන ලද අතර එමඟින් පරීක්ෂා කරන ලද ගොවිපොළවල සතුන්ගේ ප්‍රතිශක්ති මට්ටම මෙන්ම එන්නත්කරණයේ සාර්ථකත්වය පිළිබඳ පරීක්ෂා කරන ලදී. මානව සම්පත් හිඟය හේතුවෙන් අපේක්ෂිත PCR පරීක්ෂණ ප්‍රගතිය ළඟාකර ගත නොහැකි වූ අතර අනුමැතිය සම්බන්ධ ගැටළු හේතුවෙන් එම පරීක්ෂණ සඳහා වූ අපේක්ෂිත රසායන ද්‍රව්‍ය හා පරීක්ෂණ කට්ටල මිලදී ගැනීමට නොහැකි විය.ඉදිරියේදී අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළ පරීක්ෂාව හා නියැදි පරීක්ෂා කිරීමට අදාළ කටයුතු සැලසුම් කර ඇත.

2.1.3. මානව සම්පත් සංවර්ධනය

අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණුව

දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන්ට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යවසායකත්ව හා ආයෝජන ප්‍රවර්ධන ඒකකය මඟින් සමාලෝචිත කාල සීමාව තුළදී කිරි නිෂ්පාදනය හා කුකුළු පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන් 12 ක් ව්‍යවසායකයින් ඇතුළු විවිධ ආයතන වල නිලධාරීන් රැසක් සඳහා ලබා දී ඇත.

පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික (NVQ 06) ඩිප්ලෝමා පාඨමාලාව (අධ්‍යයන වර්ෂ 2023-2024 සඳහා) හදාරන සිසුන් 56 ක් සීප්පුකුලම ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ සහ සිසුන් 54 ක් කරඳගොල්ලේ පිහිටි ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ ඉතා සාර්ථකව පාඨමාලාව හදාරමින් සිටියි. එම කණ්ඩායම 2024 වර්ෂයේ පාඨමාලාව අවසන් කිරීමට නියමිතය.

ආ. තොරතුරු බෙදාහැරීම

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබාදීම සිදුකරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී තොරතුරු අඩංගු පොත් 18,408 ක් අලෙවි කිරීමට හැකිවූ අතර ප්‍රදර්ශන 04 ක් සඳහා දායකත්වය ලබා දී ඇත. රූපවාහිනී/වීඩියෝ ප්‍රචාරක වැඩසටහන් 24 ක් සහ ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 48 ක් ඉදිරිපත් කර ඇත.

2.1.4. නීතිමය කටයුතු සහ සේවාවන්

අ. සත්ත්ව ගොවිපොළ ලියාපදංචි කිරීම

පශු සම්පත් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින කිරි ගොවිපළ දත්තයන් නිවැරදිව හඳුනාගැනීමේ අරමුණින් ගොවිපළ වාර්ෂිකව නැවත ලියාපදිංචි කිරීම් සඳහා වූ විද්‍යුත් දත්ත පද්ධතියක් 2022 වර්ෂයේ ස්ථාපිත කරන ලදී. 2023 වර්ෂයේදී සියළුම පළාත් සඳහා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලදී.

ගොවිපළ නැවත ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය රෙජිස්ටර් 144 ක්, සිංහල හා දමිළ භාෂාවෙන් සකස් කර මුද්‍රණය කරන ලද ආකෘති පත්‍ර 44,700 ක්, ගොවිපළ කාඩ්පත් 31,500 ක් සහ දැනුවත් කිරීමේ පෝස්ටර් 650 ක් දිවයිනේ සියළුම පශු වෛද්‍ය කාර්යාල ආවරණය වන පරිදි පළාත් කාර්යාල සඳහා 2023 වර්ෂයේදී බෙදා දෙන ලදී. 2023 පෙබරවාරි මස 01 දින සිට 2024.01.31 දින දක්වා කාලය තුළ පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් ගොවිපළ ලියාපදිංචියට අදාල දත්ත විද්‍යුත් දත්ත පද්ධතිය සඳහා ඇතුලත් කර ඇත.

2023.12.31 වන විට ගොවිපළ 55,394 සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත.

ආ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 120,000 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂවල දී හඳුනා ගැනේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

2.1.5. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේදී පශු පර්යේෂණ ආයතනයේ, සත්ත්ව පෝෂණ අංශයේ පවතින විද්‍යාගාරය වැඩි දියුණුකර ඇත. එමෙන්ම සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 7,274 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

ආ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන

මෙම වැඩසටහන අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, නුවරඑළිය, කුණ්ඩසාලේ, දඹුල්ල, හෝමාගම, පොළොන්නරුව හා රත්නපුරය පශු විමර්ශන මධ්‍යස්ථාන යටතේ ක්‍රියාත්මක වේ. එමගින් වනජීවීන්ගේ පවතින සත්ත්ව රෝග ගෘහාශ්‍රිත හා කෘෂිකාර්මික සතුන් වෙත බෝවීමේ අවධානම අවම කිරීම සඳහා ආවේක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. මේ වන විට වනජීවී කලාප ආශ්‍රිත දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන මගින් වනජීවී කලාප ආවරණය වන පරිදි, රෝග වලින් මිය ගිය සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ 74 ක් සිදුකර ඇත. එම සාම්පල 43 ක් පශු විමර්ශන මධ්‍යස්ථාන මගින් ද, 26 ක් පශු පර්යේෂණ ආයතනය මගින් ද රසායනාගාර පරීක්ෂාවන්ට ලක්කර ඇත. මීට අමතරව දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරි හා වනජීවී නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වමින් දැනුවත් කිරීම් සිදුකරමින් පවතී.

2.2. 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

2.2.1. සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාන්ත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2024 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණ කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

එන්නත් වර්ගය	*ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය*
කුර සහ මුඛ රෝග	*300,000*
කාලගාන්ත්‍රා	*130,000*
රක්තාශ්‍රව රෝග	*150,000*

ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

පශු පර්යේෂණ ආයතනය මගින් 2024 වසර සඳහා සතුන්ගේ බෝවන රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පහත අයුරින් එන්නත් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

එන්නත් වර්ගය	*ප්‍රමාණය*
කුර හා මුඛ	*300,000*
රක්තාශ්‍රව	*40,000*
කාලගාන්ත්‍රා	*130,000*
බෘසෙල්ලා	*10,000*
රැනිකට්	*3,100,000*

ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා පිහිට වූ සම්බන්ධීකරණ ඒකකය වැඩිදියුණු කිරීම, වනජීවී රෝග හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ රසායනාගාර ශක්තිමත් කිරීම සහ වනජීවී රෝග ආවේක්ෂණයට අදාල පරීක්ෂණ කටයුතු සිදු කිරීම හා නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය සිදු කිරීමට මෙමගින් බලාපොරොත්තු වේ.

2.2.2. නීතිමය කටයුතු සහ සේවාවන්

අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2024 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන් 100,000 ක් සඳහා 2024 වසරේදී කන් සලකුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ

ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

2.2.3. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන අතර දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිතයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමට අදාල පර්යේෂණ කටයුතු සිදු කරයි.

2.3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

2023 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති 2024 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඊට අමතරව එක් නව ව්‍යාපෘති යෝජනාවක් 2023 වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යවා ඇත. එම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රු.මි.35 ක ප්‍රතිපාදන අනුමත වී ඇත.

#	ව්‍යාපෘතිය	කාල සීමාව	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	අරමුණු
1	දේශීය කිරි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාගේ ආදායම ඉහළ නැංවීම	අවු. 05	2910.45	නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් කුඩාගොවිපළවල කාර්යක්ෂමතාවය වැඩිකරමින් නැවුම් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

Dr. (Mrs.) K.A.C.H.A. Kothalawala
Director General
Dept. of Animal Production & Health
P. O. Box 13, Gatambe
Peradeniya

3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	කතය 2023 රු.	2022 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	පාදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසටි 1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු පාදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-		
-	භාණ්ඩාගාර අනුග්‍රහ		1,109,849,000	1,017,560,000	එසටි-3
-	තැන්පතු		32,001,642	8,927,383	එසටි-4
-	අත්තිකාරම් ගිණුම්		31,221,729	29,916,211	එසටි-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,173,072,371	1,056,403,594	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,173,072,371	1,056,403,594	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-		
	ශුද්ධ පාදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,173,072,371	1,056,403,594	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
-	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	525,093,369	539,071,500	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	170,142,771	116,475,614	එසටි-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ ආරුකිරීම්	7	24,506,745	23,446,528	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තක වියදම්	9	-	-	
-	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		719,742,885	678,993,642	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පූනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	12,006,145	14,309,464	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,233,627	4,610,068	
-	ණ්ඩන ආරුකිරීම්	12	-	-	එසටි 2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	27,026,834	25,517,010	
-	වෙනත් මූලධන වියදම්	15	468,557,128	385,861,501	
-	මුළු මූලධන වියදම් (උ)		509,823,734	430,298,043	
	නැන්පතු ගෙවීම්		30,248,956	16,841,275	එසටි-4
	අත්තිකාරම් ගෙවීම්		26,450,580	20,048,778	එසටි-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		56,699,536	36,890,054	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,286,266,154	1,146,181,739	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(113,193,784)	(89,778,145)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය නුවූ ශේෂය		(113,193,784)	(89,778,145)	එසටි-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(113,193,784)	(89,778,145)	එසටි-3

එස්.එච්.එම්.සී. ලුහාන්ත හේරත්
ප්‍රධාන ගණකාධිකාරි (වැ. බ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නැවතුම් පේරාදෙණිය

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023	2022
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,192,200,479	3,140,915,577
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	80,629,343	85,400,492
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**3,272,829,822**	**3,226,316,069**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		62,302,692	68,826,528
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,192,200,479	3,140,915,577
කුලී සහ වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	18,326,651	16,573,964
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-
මුළු වගකීම්		**3,272,829,822**	**3,226,316,069**

පිටු අංක 01 සිට 40 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ඇමුණුම් පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 41 සිට 86 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්හිම ඇස්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ ඵනඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2024.02.19	දිනය :2024.02.19	දිනය :2024.02.19
ජානක ධර්මකීර්ති ලේකම් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අංක. 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.	ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල අධ්‍යක්ෂ ජනරාල් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තැ.පෙ. 13, ගැටඹේ පේරාදෙණිය	එස්.එච්.එම්.සී. ලුෂාන්ත හේරත් ප්‍රධාන ගණකාධිකාරී (වැ. බ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගැටඹේ පේරාදෙණිය

ගිණුම් විගණන ශාඛාව
27 FEB 2024

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	රුපියල්	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, ඵධිහාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	127,671,642	93,917,293
අනුමත ලැබීම්	1,109,849,000	1,017,560,000
අත්තිකාරම් අයකර ගැනීම්	29,857,040	30,398,928
තැන්පතු ලැබීම්	32,001,642	8,927,383
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,299,379,325	1,150,803,604
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	695,236,140	655,547,114
සහනාධාර සහ මාරුකිරීම්	24,506,745	23,446,528
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	17,685,358	19,383,453
භාණ්ඩාගාරයට ආපසු ලබා දීම්	-	-
අත්තිකාරම් ගෙවීම්	26,450,580	20,048,776
තැන්පතු ගෙවීම්	30,248,956	16,841,275
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	794,127,778	735,267,147
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	505,251,547	415,536,457
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	505,251,547	415,536,457
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (ඉ)	505,251,547	415,536,457
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(505,251,547)	(415,536,457)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

එස්.එච්.එම්.සී. ලුහාන්ත හේරත්
ප්‍රධාන ගණකාධිකාරී (වැ. බ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ පේරාදෙණිය

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) ඒකාබද්ධකරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම් වැඩිදියුණු කළ මූදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

භූවමාරු හා භූවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මූදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මූදල් හා මූදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මූදල් හා මූදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මූදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල ඵලදායී පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ''වාර්තාකරණ පදනම'' යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

එස්.එච්.එම්.සී. ගුණාත්ත හේරත්
ප්‍රධාන ගණකාධිකාරි (වැ. බ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ පේරාදෙණිය

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ඒකීය -2

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

යදම් ශීර්ෂ අංකය : 292

රු.

වාර්ෂික ඇස්තමේන්තුගත වැඩසටහන් අංකය	වියදමෙහි නාම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ර. 66/69 මාරු කිරීම (3)	මූල ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) ප්‍රහරණවර්ධන	802,100,000		-	802,100,000	719,742,884	82,357,116
	(2) ප්‍රාග්ධන	91,000,000		-	91,000,000	48,179,165	42,820,835
	උප එකතුව	893,100,000		-	893,100,000	767,922,049	125,177,951
වැඩසටහන (2)	(1) ප්‍රහරණවර්ධන						
	(2) ප්‍රාග්ධන	776,000,000			776,000,000	461,644,568.00	314,355,432.00
	උප එකතුව	776,000,000		-	776,000,000	461,644,568.00	314,355,432.00
	මුළු එකතුව	1,669,100,000		-	1,669,100,000	1,229,566,617.00	439,533,383.00


.....
ප්‍රධාන ගිණුම් නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය)
දිනය :2024.02.19

ඩබ්.එම්.එම්.සී. ගුණරත්න
ප්‍රධාන ගණකාධිකාරි (වැ. ව)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගම්පහ ශ්‍රේෂ්ඨාගාරය

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යූහයන්	-	1,124,124,971.54	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	624,720,804.29	-	-
9153	ඉඩම්	-	1,443,354,759.04	-	-

3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිවිඔස/සෙක්ව/සෑන්/විදුත්ඩෙට/5/2024/15

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ජූ.ඩි.ටෙ දිනය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
29 MAY 2024
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
කැටගම - පේරාදෙණිය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
03 JUN 2024
කැටගම - පේරාදෙණිය

ගණන්දීමේ නිලධාරී,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කිරීමය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.

යටත්න්න විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ පැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාල අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් නොවාඩා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව කිසියම්ම කිරීමේ හොඟකි වීමේ හේතු නිරාකරණ ලබා ඒ බවද, වාවෙන දන්වා එවන ලෙසත් කාරුණිකව දන්වමි.

එච්.ඒ. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට,

පිටපත්:- 1. ගරු මුදල්, සාර්ථක ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති ඇමැතිතුමා - කා.දැ.ප.
2. ගරු කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා - කා.දැ.ඔ.

Dr. (Mrs.) K.A.C.H.A. Kothalawala
Director General
Department of Animal Production & Health
P. O. Box 13, Gatambe

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk

(7)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } දිවිසිරි/කෙඩි/ජෘ//2වසිසෙව/මි/2024/1 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 29 දින

ගෞරවාදරයෙන් නිලධාරී,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විත්තරාන්ත්‍රික කළමනාකරණ විගණන වාර්තාව.

ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය පත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා වුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වියානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගෞරවාදරයෙන් නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ යෙදෙන් පිටපතක් අඳුව කවයුතු සර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත ගයෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැසිල්ලට අත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මේම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් ගැන් කරුණක් පිළිබඳව ක්‍රියාත්මක නිර්දේශ හෝ නොගැනීමේ හේතු නිර්බෙහම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අවුලාඩු

(අ) පුනරාවර්ථන වියදම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගෞරවාදරයෙන් නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයට අදාළ 2024 ජනවාරි මස වෙළඳ නාමය දෙපළ එකතුව රු.2,836,355 ක් සමාලෝචිත වර්ෂයේ අවසානා දිනට පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශනයේ 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් 01 ට අනුව බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	වර්ෂයට අදාළ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.	2023.12.31 දිනට ගිණුම් දංශය වෙත ලැබී නිබූ වවුවරපත් පමණක් CIGAS දත්ත පද්ධතියට ඇතුලත් කල බවත් ඊට පශ්චාද වවුවරපත් ඉදිරිපත් වී නිබූ බැවින් එම වෙනස පිටු වී ඇති බව.

(ආ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

විගණන නිරීක්ෂණය			නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම		
	රු.			
i ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ 144 (1)	-	පරීක්ෂණයට භාජනය වූ උප කාර්යාල 04 ක දෛනික මුදල් ශේෂ හා දෛනික මුදල් ලැබීම් යනාදී මූල්‍ය කටයුතු අධීක්ෂණය කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය	දෛනික මුදල් ලැබීම් කටයුතු අධීක්ෂණය සඳහා ස්ථානභාර නිලධාරීන්ගේ උපදෙස් මත අධීක්ෂණ නිලධාරියෙකු නම් කර ඇති බව
ii 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති මාලාවේ XVIII ඡේදයේ 193 වන අනුඡේදය		සේවාකාලය වසර 05 කට වඩා වැඩි සෑම රජයේ නිළධාරියෙකුම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර පරීක්ෂණයට භාජනය වූ උපකාර්යාල 04 ක වසර 07 සිට වසර 28 දක්වා කාලයක සිට නිලධාරීන් 25 දෙනෙකු එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා ගෙන තිබුණි.	කාර්යය පටිපාටික රීති ප්‍රකාරව කටයුතු කල යුතුය	වසර 05 ක් ඉක්මවුවත් ඇතැම් නිලධාරීන් ස්ථානමාරු ඉල්ලුම් කර නොතිබීමත් හා ස්ථාන මාරුව සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති බව

iii ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

XV පරිච්ඡේදයේ 4 වන වගන්තිය	15,957,765	අධ්‍යන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් 08 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය සේවා කාලයක් සේවය කිරීම සඳහා එළඹී ගිවිසුම කඩකිරීම නිසා එම නිලධාරීන්ගෙන් අයවිය යුතු දඩ මුදල් අයකරගෙන නොතිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය	නිලධාරීන් 04 ගෙන් වාරික වශයෙන් මුදල් අයකරගන්නා බව

(ඇ) වංචනික ස්වරූපයේ ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් භාරකාරිනිය (සරප්) විසින් 2018 සිට 2023 ජූලි මස දක්වා කාලය තුළ දෛනිකව රැස්කරගනු ලබන ආදායමින් රු.14,749,160 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මුදල් භාරකරු වෙත භාර නොදී පෞද්ගලික පරිහරණයට ලබාගෙන අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිකුත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය.	අදහස් දක්වා නොමැත

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මුදල් රෙගුලාසි 91(1) ප්‍රකාරව බැරකම් ප්‍රමාණය සහ වැය ප්‍රමාණය වර්ෂයේ ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු බව දක්වා තිබුණද , වැය විෂයන් 03 ක ශුද්ධ ප්‍රතිපාදන මුදල වූ රු.68,700,000 ඉක්මවා රු.3,511,409 ක බැඳීම් ඇති කර ගෙන තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	**2023** වර්ෂයේ දෙසැම්බර් මස වන විට ලැබී තිබූ ජලය, විදුලිය හා ආරක්ෂක සේවාවලට අදාල වියදම් අත්‍යාවශ්‍ය බැඳීම් බැවින් ප්‍රතිපාදන මුදල ඉක්මවා බැඳීම් ඇති කර ගැනීමට සිදු වූ බව

2.4 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු නොකර කාලය ඉකුත් වූ රු.270,100 ක තැන්පතු පහක් වසර 02 ත් 04 ත් අතර කාලයක සිට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	පිළිතුරු පසුව ලබා දෙන බව

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2023 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 23 කට අදාළ වූ උප ක්‍රියාකාරකම් 42 ක ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර ක්‍රියාකාරකම් 18 ක උප ක්‍රියාකාරකම් 24 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	සැලසුම් කල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කල යුතුය.	අදාළ කාල සීමාව තුල වාර්තා වූ රෝග විමර්ෂණ වාර්තා නැවත විමර්ෂන කටයුතු සඳහා යොමු කර ඇති බව හා ක්‍රියාකාරකම් 04 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි රෝග තත්ත්වයන් වාර්තා නොවූ බව

(ii)	මූල්‍ය අක්‍රමිකතාවයට අදාලව සෘජුව වගකීමට බැඳෙන මුදල් හාරකාරිනියට (සරප්) එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද ආයතනයේ මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හා විධිමත් අධීක්ෂණයක් හා නිවැරදි සුපරීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් මෙම අක්‍රමිකතාවයට වගකීමට බැඳෙන අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අක්‍රමිකතාවයට සම්බන්ධ වගකීමට බැඳෙන අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් දක්වා නොමැත

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ කුණ්ඩසාලේ කෘතීම සිංචන මධ්‍යස්ථානය මඟින් පළාත් සභාවන් වෙත නිකුත් කරන ලද ගව ශුක්‍ර වඩි සඳහා රු.12,398,310 ක් අයවිය යුතුව පැවතුණි.	කාලපරිච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව අයකරගත යුතුය.	ගව ශුක්‍ර වඩි ගොවීන් වෙත අබණ්ඩව සපයන අතර ගව ශුක්‍ර වඩි එම රැස්වන ආදායම් පළාත් සභාවට එවීමට යම් කාලපමාවක් ගතවන බැවින් සාමාන්‍ය හිඟයක් නිරන්තරයෙන් පවතින බව

(ආ)	කොළඹ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානය තුළ ප්‍රමාණවත් විද්‍යාගාර පහසුකම් නොමැති වීම හේතු කොටගෙන ලබාගත් සත්ත්ව සහ සත්ත්ව ආහාර සාම්පල් 1,057 ක් අතුරින් 850 ක් ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයටත්, 187 ක් වැලිසර පශු පර්යේෂණ මධ්‍යස්ථානයටත් ලබා දී පරීක්ෂා කර තිබුණි. මෙම පර්යේෂණ කටයුතු සඳහා විශාල කාලයක් ගතවන බැවින් සත්ත්ව හා සත්ත්ව ආහාර ආනයනය හා අපනයන කටයුතු කෙරෙහි අහිතකර බලපෑමකට ඇති ඉඩකඩ බැහැර කළ නොහැකි විය.	ප්‍රමාණවත් විද්‍යාගාර පහසුකම් නිරෝධායන මධ්‍යස්ථානය තුල ස්ථාපිත කළ යුතුය.	විද්‍යාගාරය වැඩි දියුණු කිරීමට අවශ්‍ය රසායනාගාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කරන ලෙස ස්ථානභාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇති බව

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ පැටව් උපත් සංඛ්‍යාව පිළිවෙලින් 182, 35 හා 108 ක් දක්වා අභිජනන ක්‍රියාවලිය වර්ධනය අඩු මට්ටමක පැවතීමෙන් උසස් නිෂ්පාදන හැකියාවන් ඇති පට්ටි එළුවන් ජාතික එළු ගහණයට එකතු කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.	ව්‍යාපෘතියේ සැලසුම් කළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	සතුන් අතර පවතින මන්ද පෝෂණ තත්ත්වය හේතුවෙන් නැවත මෙම සතුන් පට්ටියට පැමිණීම අඩු මට්ටමක පැවති බැවින් ගැබ් ගැනීමේ ප්‍රතිශතය අඩු වී ඇති බව

(ආ)	වසරකට 50 බැගින් වසර 05 ක් තුල එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීමේ අරමුණින් 2019 වර්ෂයේදී ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය තුල බෝයර් වර්ගයේ එළු අභිජනන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය අවසන් වන විට රු.91,970,290 ක වියදමක් දරා තිබුනු අතර ඉන් රු.2,362,442 ක ආදායමක් පමණක් ලබා ගෙන තිබුණි. මෙම කාලය තුල එළුවන් 23 ක් පමණක් ක්ෂේත්‍රයට නිකුත් කර තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	රෝග පාලනයක් ව්‍යාපෘතියේ සැලසුම් කල අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය.	නිරෝධායන කාල සීමාව තුළ B/T හා CAE ප්‍රතිදේහ හමුවීම නිසා ආනයනික එළු කණ්ඩායම විටින් විට පරීක්ෂා කළ අතර රෝග කාරක සහිත සතුන් හමු වූ අතර ඒ අනුව ක්ෂේත්‍රයට මේ වන විට සතුන් නිකුත් කිරීම නතර කර ඇති බව
(ඇ)	තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ සතුන්ගේ රෝග විනිශ්චය, රෝග නිර්ණය සහ රෝග මර්ධනය යන රාජකාරී නිසිලෙස ඉටුකොට සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා පත්කරන ලද වෛද්‍යවරයා අභිජනන මධ්‍යස්ථානයේ රාජකාරී සඳහා 2022 වර්ෂයේදී දින 03 ක් වැනි සීමිත දින ගණනක් හා සමාලෝචිත වර්ෂයේ දින 23 ක් මධ්‍යස්ථානය නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව එම වෛද්‍යවරයාගේ අපේක්ෂිත රාජකාරී ඉටු වී නොතිබුණු අතර එම කාල පරිච්ඡේදය තුලදී සතුන් මිය යාමද පිළිවෙලින් 141 ක් හා 35 ක් ලෙස ඉහල අගයක් ගෙන තිබුණි.	අභිජනන මධ්‍යස්ථානය සඳහා පහසුවෙන් ලභාවිය හැකි වෛද්‍යවරයෙකු වෙත රාජකාරී පැවරිය යුතුය.	2022 වර්ෂය තුළ පැවති අර්බුදකාරී ආර්ථික වාතාවරණය තුළ පොදු ප්‍රවාහනය භාවිතා කිරීමේ අපහසුතා මෙන්ම පැවති ඉන්ධන හිඟය වැනි නොවැළැක්විය හැකි හේතු නිසා ප්‍රධාන කාර්යාලයේ සිට පශු වෛද්‍යවරුන්ගේ සේවය අඛණ්ඩව එම තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය වෙත සැපයීමට නොහැකි වූ බව

(ඇ)	කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ 2018 වර්ෂයේදී ඩිප්ලෝමාධාරියෙකු බිහි කිරීම වෙනුවෙන් දරන ලද වියදම රු.600,000 ට ආසන්න අගයක් ගෙන තිබූ අතර 2019 – 2022 අතර කාලය තුලදී එය ලක්ෂ 11 සිට ලක්ෂ 18.5 දක්වා වැඩි වී තිබුණි. එක් ඩිප්ලෝමාධාරියෙකු වෙනුවෙන් වර්ෂයයකට දරන පිරිවැය අවම කර ගැනීම සඳහා ලියාපදිංචි කර ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කිරීම , පාඨමාලාව හැරයාමේ ප්‍රමාණය අවම කර ගැනීමට ක්‍රියා කිරීම එක් එක් වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම් අවම කර ගැනීම වැනි ක්‍රියාමාර්ග ගෙන පිරිවැය අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	වියදම් කළමනාකරණය කර පාඨමාලා හැර යන සිසුන් අවම කර කාර්යක්ෂමතාව වැඩි කල යුතුය.	අදහස් දක්වා නොමැත

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය	වාර්ෂික කාර්යසාධන වාර්තාව, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් **2024.01.03** දින එවන ලද ඉල්ලීමට අනුව හා එම අමාත්‍යාංශය විසින් එවන ලද ආකෘතියට අනුරූපව සකස්කර අමාත්‍යාංශ ලේකම් මගින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ, සැලසුම් අංශය වෙත **2024.02.05** දින යවා ඇති බව

3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ වසරකට සිසුන් 100 දෙනෙකු පුහුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් පැවතියද 2019 – 2022 හා 2022 – 2024 යන අධ්‍යන වර්ෂ දෙකම වෙනුවෙන් සිසුන් 137 ක් පමණක් ලියාපදිංචි වීමෙන් පවතින සම්පත් ඌණ උපයෝජිතව තිබුණි.	පවතින සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කල යුතුය.	මෙම විද්‍යාලයේ දේශනශාලා පුළුල් කිරීම තුළින් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා සිසුන් 75 දෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදහස් කරන බව
(ආ)	දඹුල්ල හා වාරියපොළ පශු විමර්ෂන මධ්‍යස්ථානයන්හි ඇඟිලි සලකුණු යන්ත්‍ර පිළිවෙලින් 2022 ඔක්තෝබර් මස සිට හා 2018 දෙසැම්බර් මස සිට ක්‍රියාවිරහිත වී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අලුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි.	ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කර නොපමාව භාවිතයට ගත යුතුය	විමර්ශන මධ්‍යස්ථාන සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලට ගත් ආයතනය අක්‍රිය යන්ත්‍ර අලුත්වැඩියාව ඉටු කර නොකිරීම හේතුවෙන් වෙනත් ආයතනයක් මගින් එම කටයුතු සිදුකරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.
(ඇ)	රු.11,611,665 ක වියදමක් දරමින් 2021 ජනවාරි 04 දින වැඩ නිම කරන ලද අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආපනශාලාවේ ඉහල මහල වසර තුනකටත් අධික කාලයක සිට අපේක්ෂිත අරමුණට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	අපේක්ෂිත අරමුණට අදාළව ගොඩනැගිල්ල භාවිතයට ගත යුතුය.	2024 වර්ෂයේ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් යටතේ ඇති ප්‍රතිපාදන වලින් මෙම අවශ්‍යතා වලින් කොටසක් හෝ ලබා ගැනීමට උත්සාහ දරන බව

(ඇ)	මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ කුකුලන් 5,181 ක උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යාමට හැකි කුකුල් නිවාස හා සම්පත් පැවතියද සමාලෝචිත වර්ෂය තුලදී කුකුලන් 1,680 ක් එනම් සියයට 32 කට අඩු ප්‍රමාණයක් නඩත්තු කිරීම තුලින් මධ්‍යස්ථානය සියයට 68 ක් ඌණ උපයෝජිතව පැවතුණි.	කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යායුතුය	ගොවිපලෙහි කුකුළන් 5000 ට වැඩි ප්‍රමාණයක් ඇති කිරීමට තරම් කුකුල් නිවාසවල ඉඩකඩ පවතින නමුත් බීජරක්වනාගාරයේ ධාරිතාවය ඇත්තේ බිත්තර 8400 කට පමණක් බැවින් බීජ රක්වනාගාරයට අවශය setter යන්ත්‍රය මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව

3.5 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කල මූල්‍ය ප්‍රකාශන අනුව අවස්ථා 18 කට අදාළව එකතුව රු.21,299,643 ක පාඩු හා හානි සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය	මු.රෙ. 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තා හා 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තා ලබා ගැනීම අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බව

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය සඳහා 2022 අගෝස්තු 15 දින රු.96,548,000 ට ස්වයංක්‍රිය පෙව ප්‍රතිකාරක යන්ත්‍රයක් මිලදී ගෙන සවිකර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින තෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. අනාගත සැලසුම් පිළිබඳ පුරෝකථනයක් සිදු කර එම අවශ්‍යතාවයට අනුව නිෂ්පාදන ධාරිතාවය තීරණය කර ඊට අදාළ වන යන්ත්‍ර මිලදී ගැනීම් කෙරෙහි අවධානය යොමු නොකර ඉතා ඉහල ධාරිතාවයකින් යුතු ඉහල මිලකට යන්ත්‍රය මිලදී ගෙන තිබුණි.	අවශ්‍යතාවය මත මිලදී ගැනීම් සිදු කර යන්ත්‍රය භාවිතයට ගත යුතුය	2021 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මෙම මිලදී ගැනීම සිදු කර ඇති බව
(ආ)	කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ අධ්‍යන වර්ෂ 06 ක තොරතුරු අනුව ඩිප්ලෝමා පාඨමාලාව හැරගිය සිසුන්ගේ ප්‍රතිශතය සියයට 27 ක ඉහල අගයක් ගෙන තිබුණු අතර පාඨමාලාව හැර යන සිසුන් වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඒ අනුව පවතින සම්පත් උපරිමව උපයෝජනය කරගනිමින් පුහුණු පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් ජාතික ආර්ථිකයට මුදා හැරීමේ අවශ්‍යතාවය පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.	පාඨමාලාව හැරයන සිසුන් ප්‍රමාණය අවම කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය.	පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු වෙනත් උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් හා විවිධ රැකියා අවස්ථාවන් වෙත යොමු වීම හේතුවෙන් පාඨමාලාව හැර යනු ලබන සිසුන්ගෙන් දෙපාර්තමේන්තුව ඔවුන් වෙනුවෙන් දැරූ වියදම් අයකර ගැනීමට ගිවිසුමක් සකස් කර නීති අංශය වෙත යොමුකර ඇති අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් මේ දක්වා ලැබී නොමැති බව

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
තිරසර සංවර්ධන අරමුණු 03ක් වෙනුවෙන් ඉලක්ක 06 ක් කරා ලඟාවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර ඉන් ඉලක්ක 02 ක ප්‍රගතිය සියයට 50 ත් 74 අතර මට්ටමක පැවතුණි.	අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය.	පැවති ආර්ථික අර්බුදකාරී තත්ව යටතේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟාවීමට නොහැකි වුවත් ක්‍රමානුකූලව ඉලක්ක වෙත ලඟා වීම සඳහා අවශ්‍ය උපායමාර්ගික ක්‍රියාකාරකම් සකස් කරමින් පවතින බව

5. යහපාලනය

මහජනයා වෙත සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොවිපලහි කුකුල් පැටවුන් අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම විධිමත්ව සිදු නොවන බවද පැටවුන් නිකුත් කිරීමේදී එකම පාරිභෝගික කණ්ඩායමක් වෙත කුකුල් පැටවි නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම වැඩියෙන් ඉල්ලුම් කරන්නන් වෙත සැපයුම් කිරීමටත් කුඩා ප්‍රමාණයක් ඉල්ලුම්කරන ඉල්ලුම්කරුවන් වෙත පැටවි ලබා දීමට කටයුතු නොකරන බව නිරීක්ෂණය වූ අතර 2023 මාර්තු මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ එකම පුද්ගලයෙකුට සතියකට කුකුලු පැටවුන් 500 ක් බැගින් කුකුල් පැටවුන් 12,000 ක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.	සියලුම ඉල්ලුම්කරුවන් අතර නිසි ක්‍රමවේදයක් යටතේ පැටවුන් නිකුත් කිරීම කල යුතුය	පැටවි ඉල්ලුම්කරන සියළුම පාරිභෝගිකයන් වෙත සාධාරණයක් ඉටුකිරීම වගකීම වන නමුත් ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති බැවින් සියලු පාරිභෝගික අවශ්‍යතා සපුරාලිය නොහැකි බව

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
01	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/ වසරකට)	✓		
02	වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/ වසරකට)	✓		
03	වාර්ෂික බිත්තර නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රවණතාවය (බිත්තර ගණන/ වසරකට)	✓		
04	වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට)	✓		
05	වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රවණතාවය (කි.ග්‍රෑම් වසරකට)	✓		
06	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වැඩිවීමේ ප්‍රමාණය			✓

**පශු වෛද්‍ය කාර්යාල මාසික වාර්තා, කුකුළු අභිජනන මාසික වාර්තා මත පදනම් වූ ඇස්තමේන්තුකළ නිෂ්පාදන දත්ත සහ මහ බැංකු වාර්ෂික වාර්තා මගින් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත.*

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49	50%-74%	75%-100%
(i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	වසර 2023 වන විට දේශීය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 389 වෙත ළඟා වීම	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/ වසරකට)			✓
(ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	වසර 2023 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 87 වෙත ළඟා වීම වාර්ෂික බිත්තර නිෂ්පාදනය මිලියන 2,043 වෙත ළඟා වීම	වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/ වසරකට) වාර්ෂික බිත්තර නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රවණතාවය (බිත්තර ගණන/ වසරකට)		✓	

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49	50%-74%	75%-100%
(iii) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම	වසර 2023 වන විට වාර්ෂික ඒක පුද්ගල කුකුල් මස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 9.8 වෙත ළඟා වීම වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රවණතාවය 236,000,000 (කි.ග්‍රෑම් වසරකට)	වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කුකුල් මස් කිලෝ ග්‍රෑම් /වසරකට) වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රවණතාවය (කි.ග්‍රෑම් වසරකට)			✓
	කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1% - 1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය		✓	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන් 2023 වර්ෂයේ මුල්භාගයේ ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑමට ලක්විය. එසේම විදේශ විනිමය රටතුළ සීමාවීම, කුකුළු පැටවුන් හිඟය, සත්ත්ව ආහාර හිඟය සහ සත්ත්ව ආහාරවල මිළ ගණන් ඉහළ යාම යනාදී කරුණු හේතුවෙන් 2023 වර්ෂයේ අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා සැළකිව යුතු බලපෑමක් ඇතිකරන ලදී.

මෙම ආර්ථික අර්බුදයත් සමඟ කුකුළු නිෂ්පාදන ක්ෂේත්‍රය මුහුණ පෑ සත්ත්ව ආහාර හිඟය සහ මිළ ඉහළයාමේ බලපෑම මෙන්ම මව් සතුන් ආනයනය කරනු ලබන රටවල කුරුළු උණ වසංගතය ව්‍යාප්ත වීම හා විදේශ මුදල් ප්‍රේෂණය සීමා කිරීම යනාදී කරුණු මෙම ක්ෂේත්‍රයේ සමස්ත නිෂ්පාදනය අඩුවීමට ප්‍රබල ලෙස බලපාන ලදී. දේශීය බිත්තර නිෂ්පාදනය 2022 වර්ෂයට සාපේක්ෂව 2.2% අඩුවීමක් දක්නට ලැබුණි. මේ හේතුවෙන් රටෙහි බිත්තර හිඟයක් ඇතිවූ අතර, වෙළඳපොළ මිළ පාලනය සඳහා රජය විසින් බිත්තර ආනයනය කිරීමට තීරණය කරන ලදී. එහෙත් කුකුළු මස් කර්මාන්තය ද ඉහත සියළු අභියෝගයන්ට ලක්වූ අතර නිෂ්පාදන චක්‍රය කෙටිවීම සහ මහා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන නිසා වෙළඳපොළ ස්ථාවරත්වය ඇතිවිණි. 2023 වර්ෂයේ කුකුළු මස් නිෂ්පාදනය 2022 වර්ෂයට සාපේක්ෂව 3.3% ක වර්ධනයක් දක්නට ලැබේ. නමුත් කුකුළු මස්වල මිළ 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ වැඩි අගයක් ගෙන තිබුණි.

කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය රටෙහි පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් බලපෑමට ලක්වූ අතර, සමස්ත නිෂ්පාදනයෙහි ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව සමස්ත කිරි නිෂ්පාදනයේ 2.8% අඩුවීමක් දක්නට ලැබුණි. ඊට සමගාමීව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේ ආනයනික කිරි ප්‍රමාණය 24.4% ක වැඩිවීමක් ලෙස දක්නට ලැබුණි.

2023 වර්ෂයේ මුල්භාගයේ පැවති ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් එළු සහ සූකර ක්ෂේත්‍රවල නිෂ්පාදන ඉලක්ක සඳහා ද බලපාන ලද නමුත් 2023 වසර අවසන් වන විට එම ක්ෂේත්‍ර වල සැළකිව යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	195	138	57
තෘතීයික	22	16	06
ද්විතීක	340	296	44
ප්‍රාථමික	395	292	103

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනයක් වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, නාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරී ඇත.

පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

නිරෝගීමත් සත්ත්ව ගහණයක් හා වැඩි නිෂ්පාදන ඵලදායීතාවයකින් යුතු ආහාර සුරක්ෂිත තාවයක් හා ආහාරයන්හි සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීම් ක්ෂේත්‍රයේ පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ලබා දීම උදෙසා තාක්ෂණික මඟ පෙන්වීම හා සහාය ලබා දීමේදී අදාල කාර්යභාරයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම නිසා ආයතනික ඉලක්ක හා අරමුණු ලගා කර ගැනීමේදී බාධා මතුවේ.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	*පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව*	*වැඩසටහනේ කාල සීමාව*	*සමස්ත ආයෝජනය*		*වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)*	*නිමවුම/ ලබාගත් දැනුම*
			දේශීය	*විදේශීය*		
මානසික සෞඛ්‍ය	36	දින 01	18,900.00		දේශීය	ආතති කළමණාකරණය තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීම
පශු සම්පත් ආර්ථිකය හා දත්ත කළමණාකරණය	36	දින 01	4,370.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලය/ස.නි.හා.සෞ.දෙ සම්බන්ධව පැවති කිරිගව ක්ෂේත්‍රය පිළිබඳ වැඩසටහන	59	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	කිරිගව ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත්වීම
ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලය/ස.නි.හා.සෞ.දෙ සම්බන්ධව පැවති සත්ත්ව පෝෂණය පිළිබඳ වැඩසටහන	53	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	සත්ත්ව පෝෂණය පිළිබඳ දැනුවත්වීම
MS Excel	10	දින 03	16,280.00		දේශීය	MS Excel සම්බන්ධව දත්ත නිවැරදිව හැසිරවීම
බෘඩර් කළමනාකරණය	74	දින 01	3,000.00		දේශීය	බෘඩර් කළමනාකරණය පිළිබඳ දැනුවත්වීම
පශු සම්පත් ආර්ථික හා දත්ත කළමණාකරණය	44	දින 01	5,060.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
ආයතනික කළමනාකරණය	44	දින 03	64,510.00		දේශීය	ආයතනික කළමනාකරණය පිළිබඳ දැනුවත්වීම
නායකත්වය, ගැටළු විසඳීම සහ තීරණ ගැනීම	40	දින 02	41,965.00		දේශීය	නායකත්වය, ගැටළු විසඳීම සහ තීරණ ගැනීම පිළිබඳ දැනුවත්වීම
පශු සම්පත් ආර්ථික හා දත්ත කළමණාකරණය	40	දින 01	2,250.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
MS Excel	10	දින 03	30,970.00		දේශීය	MS Excel සම්බන්ධව දත්ත නිවැරදිව හැසිරවීම
පශු සම්පත් ආර්ථික හා දත්ත කළමණාකරණය	40	දින 01	21,600.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලය/ස.නි.හා.සෞ.දෙ සම්බන්ධව පැවති කිරිගව ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන	28	දින 02			දේශීය	කිරිගව ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රායෝගික දැනුවත්වීම
ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලය/ස.නි.හා.සෞ.දෙ සම්බන්ධව පැවති කිරිගව ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන	20	දින 02			දේශීය	එම
රසායනාගාර සහායක නිලධාරින් සඳහා ආතති කළමණාකරණය	19	දින 01	53,265.00		දේශීය	ආතති කළමණාකරණය තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීම
රියදුරු නිලධාරින් සඳහා ආතති කළමණාකරණය	29	දින 01			දේශීය	එම

වැඩසටහනේ නම	*පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව*	*වැඩසටහනේ කාල සීමාව*	*සමස්ත ආයෝජනය*		*වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)*	*නිමවුම/ ලබාගත් දැනුම*
			දේශීය	*විදේශීය*		
කාර්යාල සහායක නිලධාරින් සඳහා ආතති කළමණාකරණය	25	දින 01			දේශීය	ආතති කළමණාකරණය තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීම
ක්ෂේත්‍ර සහායකයින් සඳහා විනය ක්‍රියාමාර්ග පටිපාටිය	34	දින 01	50,530.00		දේශීය	විනය පාලනයේ වැදගත්බව පිළිබඳ දැනුවත්වීම
පශු අණපනත් හා නීති	60	දින 01	3,600.00		දේශීය	පශු අණපනත් හා නීති, රෙගුලාසි සම්බන්ධව දැනුවත් වීම
MS Access	10	දින 03	24,975.00		දේශීය	දත්තපද්ධති සංවර්ධනය පිළිබඳ හැකියාව දියුණු කිරීම
පශු සම්පත් ආර්ථික හා දත්ත කළමණාකරණය	40	දින 01	2,990.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
ජාතික කිරි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	26	දින 01			දේශීය	ජාතික කිරි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් වීම
පශු සම්පත් ආර්ථික හා දත්ත කළමණාකරණය	40	දින 02	3,325.00		දේශීය	පශු සම්පත් දත්ත හැසිරවීම පිළිබඳ දැනුවත්වීම
කාර්යාල ලිපි සහ කාර්යාල සටහන් ලිවීම	37	දින 01	11,945.00		දේශීය	කාර්යාල ලිපි සහ කාර්යාල සටහන් ලිවීම පිළිබඳ දැනුවත් වීම
පශු වෛද්‍යවරුන් සඳහා LSD සහ PRRS යන රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	100	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	LSD සහ PRRS යන රෝග පිළිබඳව දැනුවත්වීම
පශු වෛද්‍යවරුන් සඳහා LSD සහ PRRS යන රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	80	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	LSD සහ PRRS යන රෝග පිළිබඳව දැනුවත්වීම
MS Excel	11	දින 03	22,135.00		දේශීය	MS Excel යෙදවුම පිළිබඳව දැනුවත්වීම
ආතති කළමණාකරණය සහ ධනාත්මක චින්තනය	39	දින 01	14,90.00		දේශීය	ආතති කළමණාකරණය සහ ධනාත්මක චින්තනය තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	29	දින 01	28,555.00		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීම
ස.නි.හා.සේ.සේවයේ ශ්‍රේණියේ නිලධාරින් සඳහා සත්ත්ව සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	37	දින 03	මාර්ගගත ක්‍රමය		දේශීය	සත්ත්ව සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම
පශු වෛද්‍ය පුහුණුව හා සත්ත්ව සුබසාධනය පිලිබඳ භූමිකාව	61	දින 02	මාර්ගගත ක්‍රමය		දේශීය	පශු වෛද්‍ය පුහුණුව හා සත්ත්ව සුබසාධනය පිලිබඳ දැනුවත්වීම
Concept Note Writing	66	දින 01	3,600.00		දේශීය	ව්‍යාපෘති සංකල්ප සටහන් ලිවීම පිළිබඳව දැනුවත්වීම
පශු වෛද්‍ය වසංගතවේදය සහ සත්ව සෞඛ්‍ය ආවේක්ෂණය	43	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	පශු වෛද්‍ය වසංගතවේදය සහ සත්ව සෞඛ්‍ය ආවේක්ෂණය පිළිබඳව දැනුවත්වීම
ආහාර කළමණාකරණය	40	දින 01	4,000.00		දේශීය	ආහාර කළමණාකරණය පිළිබඳව දැනුවත්වීම
Preparation of Standard Operational Procedure	39	දින 01			දේශීය	

වැඩසටහනේ නම	*පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව*	*වැඩසටහනේ කාල සීමාව*	*සමස්ත ආයෝජනය*		*වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)*	*නිමවුම/ ලබාගත් දැනුම*
			දේශීය	*විදේශීය*		
තිරසර පශු නිෂ්පාදනය සම්බන්ධ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය	61	දින 02	මාර්ගගත ක්‍රමය		දේශීය	පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය
ව්‍යාපෘති සැලසුම්කරණය	15	දින 02	62,345.00		දේශීය	ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ දැනුවත් වීම
ආතති කළමණාකරණය	126	දින 03	37,400.00		දේශීය	ආතති කළමණාකරණය තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාගැනීම
සුකර කළමණාකරණය සහ සංවර්ධනය	26	දින 01	72,655.00		දේශීය	සුකර කළමණාකරණය සහ සංවර්ධනය පිළිබඳ දැනුවත්වීම
කිරිගව පාලනය	49	දින 03	මාර්ගගත ක්‍රමය		දේශීය	කිරිගව පාලනය පිළිබඳ දැනුවත් වීම
රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය	85	දින 01	3,000.00		දේශීය	වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුවත්වීම
නවීන කිරිගව පාලනය	25	දින 01	26,740.00		දේශීය	නවීන කිරිගව පාලනය පිළිබඳ දැනුවත්වීම
කිරිගව පෝෂණය	33	දින 01	මාර්ගගත ක්‍රමය		දේශීය	කිරිගව පෝෂණය පිළිබඳ දැනුවත්වීම
වෙළඳ පහසුකරණය සඳහා පශු වෛද්‍ය සේවයේ ඉල්ලුම	35	දින 01	මාර්ගගත ක්‍රමය			වෙළඳාම සඳහා පශු වෛද්‍ය සේවාවන් සංවර්ධනය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත්වීම
විනය ක්‍රියාමාර්ග පටිපාටිය	48	දින 01			දේශීය	විනය පාලනයේ වැදගත්බව පිළිබඳ දැනුවත්වීම
කිරිගව ගොවිපළ සංවර්ධනය	41	දින 01	18,300.00		දේශීය	කිරිගව ගොවිපළ සැලසුම්කරණය පිළිබඳ දැනුවත්වීම
නායකත්ව පුහුණු, ගැටළු නිරාකරණය සහ තීරණ ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන	48	දින 01	2,400.00		දේශීය	නායකත්වය, ගැටළු නිරාකරණය සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් හැකියාව වැඩිදියුණු කිරීම
රුධිර සහ ආහාර මාර්ග පරපෝෂිතයන් හඳුනාගැනීමේ පුහුණු වැඩසටහන	11	දින 02	42,480.00		දේශීය	රුධිර සහ ආහාර මාර්ග පරපෝෂිතයන් හඳුනාගැනීමේ පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
රුධිර සහ ආහාර මාර්ග පරපෝෂිතයන් හඳුනාගැනීමේ පුහුණු වැඩසටහන	18	දින 02	60,230.00		දේශීය	එම
	2,048		**757,565.00**			

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මූ.රෙ. 445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මූදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අංශවලින් පිළිතුරු ලබාදීමට කාලයක් ගැනීම	සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මූදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සූදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ.772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	තාවකාලිකව අත්හිටුවා ඇත.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූ.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මූදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූ.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මූ.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	විශේෂ හේතු මත ස්ථාන මාරු වීම් ලබා දීමේදී හා තාවකාලික අනුයුක්ත කිරීම් වලදී කාර්ය මණ්ඩලය ඉක්මවා යාම් සිදු වී ඇත.	ඉදිරියේදී නියමිත ස්ථාන මාරු පටිපාටි ක්‍රමවේද නිසි ආකාරයෙන් පිලිපැදීම තුලින් වලක්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පූර්ණ අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		